# විදේශීය වෙළෙඳාම (ආ)

**සාමාන්‍ය ලක්ෂණ**

1957 සිට 1960 වන තෙක් ඉහළ නගිමින් තුබුණ අපනයන වටිනාකම, 1961 දී රුපියල් කෝටි 173·3 කට අඩු විය මෙය පසුගිය වර්ෂයේ වටිනාකමට වඩා රුපියල් කෝටි 9.9 කින් අඩුය. එසේම 1954 සිටම ඉහළ නගිමින් තිබුණ ආනයන වටිනාකම 1959 රුපියල් කෝටි 200·5 ක් වීමෙන් උපරිම මට්ටමට පැමිණියේ 1960 දී රුපියල් කෝටි 196 0 කට මඳ වශයෙන් අඩු විය එහෙත් 1961 දී එය ඉතාමත් සැලකිය යුතු ප්‍රමාණයකින් රුපියල් 170 3 කට අඩු විය. මෙය 1960 වටිනාකමට වඩා රුපියල් කෝටි 25.7 කින් අඩුය මෙසේ ආනයන වටිනාකම වේගයෙන් අඩුවීම නිසා 1957 සිට අවුරුදු හතරක්ම පැවැති අවාසි සහගත වෙළෙඳ ශෙෂයෙහි රුපියල් කෝටි 3.0 ක සුළු අතිරික්තයක් 1961 දී ඇති විය.

පසුගිය වර්ෂය හා සසඳන විට, අපනයන වටිනාකම අඩුවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ අපනයන මිල සීග්‍රයෙන් අඩුවීමය. 1960 දී 104 ක් වූ අපනයන මිල දර්ශකය 1961 දී 95 කට අඩු විය අපනයන පරිමා දර්ශකය 1960 දී 103 ක් වූ අතර, 1961 දී සාමාන්‍ය වශයෙන් 107 කට වැඩි විය.

සංඛ්‍යා සටහන II—15

**අපනයන සැකසුම**

| භාණ්ඩ | වටිනාකම රුපියල් දශලක්ෂ | | | මුළු අපනයන වලින් සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1959 | 1960 | 1961 |
| තේ .. .. .. .. | 1046 | 1096 | 1115 | 59·6 | 59·8 | 64·3 |
| රබර් .. .. .. .. | 298 | 378 | 260 | 17·0 | 20·7 | 15·0 |
| ප්‍රධාන පොල් නිෂ්පාදිත තුන .. | 244 | 184 | 202 | 13·9 | 10·0 | 11·7 |
| අනෙකුත් දේශීය අපනයන .. | 104 | 117 | 104 | 6·0 | 6·4 | 6·0 |
| මුළු දේශීය අපනයන .. .. | 1692 | 1775 | 1681 | 96·5 | 96·9 | 97·0 |
| ප්‍රති අපනයන .. .. .. | 62 | 57 | 52 | 3·5 | 3·1 | 3·0 |
| එකතුව .. .. .. .. | 1754 | 1832 | 1733 | 100·0 | 100·0 | 100·0 |

සංඛ්‍යා - ලංකා රේගු වාර්තා වලිනි.

පසුගිය අවුරුදු කීපයේ සිටම තේ අපනයන පරිමාව නොකඩවාම ක්‍රමයෙන් වැඩි වෙමින් පැවැතිණි. එහෙත් වැඩිවූ පරිමාවේ තරමට මිල පහළ වැටුනේ සුළු වශයෙනි. 1957 සිට 1960 දක්වා කාලය තුළ වාර්ෂික තේ අපනයනය දළ වශයෙන් සියයට 4 කින් වැඩි වෙමින් පැවැති අතර මිල පහළ වැටී ඇත්තේ, දළ වශයෙන් වර්ෂයකට සියයට 1 කින් පමණෙකි. පසුගිය වර්ෂයේ මෙන් 1961 දී ද වැඩිවූ තේ අපනයනය මිල අඩුවීමෙන් ඇති වූ පාඩුව පිරිමසා වැඩි ආදායමකුත් ලැබීමට තරම් විය. (1960 රුපියල් කෝටි 109·6 ලැබුණ අතර 1961 රුපියල් කෝටි 111·5 ක් ලැබිණි.)

රබර් අපනයනයෙන් ලද ආදායම රුපියල් කෝටි 37.8 සිට රුපියල් කෝටි 26.0 කට අඩු විය එසේම පිටරට පටවන ලද රබර් ප්‍රමාණය ද සියයට 16 කින් අඩු විය පසුගිය අවුරුද්දේ රබර් මිල වේගයෙන් පහළ වැටිණි. පසුගිය අවුරුද්ද අවසාන වන විට ඒ අවුරුද්දේ මුල් කාලයේ දී ලැබූ වැඩිම මිලට වඩා රබර් මිල සියයට 23 කින් අඩු විය. 1961 දී ද රබර් මිල පහළ වැටෙමින් පැවතිණ. මේ මිල අඩුවීම එතරම් කැපී නොපෙනුනද, 1960 දී 130 ක් වූ රබර් මිල දර්ශකය 1961 දී 105 තෙක් අඩු විය. ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි අපනයන වටිනාකම

1959 රුපියල් කෝටි 24.4 ක් වුව ද, 1960 වන විට රුපියල් කෝටි 18.4 කට අඩු විය. එහෙත් 1961 දී නැවත රුපියල් කෝටි 20.2 කට වැඩි විය. පොල් අපනයන වටිනාකම වැඩිවීමට ප්‍රධානතම හේතුව වූයේ නොවූ විරූ ලෙස අපනයන පරිමාව වැඩිවීමය. 1960 දී 109 ක්වූ අපනයන දර්ශකය (සියයට 41 කින්) 1961 දී 154 ට ඉහළ යාමෙන් මේ පැහැදිලි වෙයි. එහෙත් පොල් නිෂ්පාදිතවල මිලෙහි දියුණුවක් ඇති නොවිණි පසුගිය අවුරුද්ද අවසානයේ දී පැවැති අඩු මිල මට්ටමට ද වඩා මිල අඩු වන්නට විය. 1961 ජනවාරි මාසයේ දී 84 ක් වූ තෙවැදෑරුම් පොල් මිල දර්ශකය 1961 නොවැම්බර් මාසය වන විට 75 තෙක් අඩු විය. වර්ෂය මුළුමනින් ගෙන බලන විට පසුගිය වර්ෂයේ 103 ක් වූ මිල දර්ශකය 80 තෙක් අඩුවී තිබුණි.

විශෙෂයෙන් රබර් සහ පොල්වල ද, මඳ වශයෙන් තේ වල ද අපනයන මිල නොකඩවා අඩුවීම නිසා 1960 දී 104 ක් වූ අපනයන මිල දර්ශකය, 1961 දී ඉහත සඳහන් කළ පරිදි 95 තෙක් අඩු විය.

1960 දී රුපියල් කෝටි 196.0 ක් වූ ආනයන වටිනාකම 1961 දී රුපියල් කෝටි 170.3 තෙක් අඩු විය. 1961 දී අපනයන ආදායම අඩු වූයේ වී නමුත්, රුපියල් කෝටි 3.0 සුළු වෙළෙඳ අතිරික්තයක් ඇති විය. මෙයට හේතු වූයේ පිටරටින් ගෙන් වන බඩු සඳහා 1961 ජනවාරි මාසයේ දී පනවන ලද දැඩි සීමා කිරීම්ය. පසුගිය අවුරුදු කීපය තුළ දී ආනයන වටිනාකම නොකඩවාම වැඩි වින මෙය 1959 දී රුපියල් කෝටි 200.5 ක උපරිම මට්ටමට පැමිණියේය. පසුගිය වර්ෂයේ එය මඳ වශයෙන් රුපියල් කෝටි 196.0 කට අඩු විය. 1960 දී 113 ක්වූ ආනයන පරිමා දර්ශකය 1961 දී 91 කට සීග්‍රයෙන් අඩු විය පාරිභෝගික භාණ්ඩ, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන භාණ්ඩ ගණ තුනෙහිම ආනයන පරිමාව අඩු විය. ඉතාමත් සීග්‍ර අඩුවීම වූයේ "අනෙකුත් පාරිභෝගික භාණ්ඩ" ගණයෙහි ආනයනයන්හිය. 1961 දී 1960 ප්‍රමාණයෙන් තුනෙන් එකකට මඳක් වැඩියෙන් පහළ වැටිණි. 1961 අපනයන මිල නොකඩවාම අඩු වූ ආනයන මිල මකාලන අයුරු අඩු වූයේ නොවේ. සියලුම ආනයන සඳහා වූ මිල දර්ශකය 1960 දී 102 ක් වුව ද, 1961 මඳ වශයෙන් 101 කට අඩු විය. මේ හේතුවෙන් 1960 දී 102 ක් වූ වෙළෙඳ අනුපාත දර්ශකය 1961 දී 94 කට පිරිහිණි.

**අපනයන**

වටිනාකම, පරිමාව සහ මිල පිළිබඳ සංඛ්‍යා 11 පරිශිෂ්ටයෙහි, 27—31 සටහන් වල දක්වා ඇත.

**තේ.**

ලංකාවේ තේ නිෂ්පාදනය පිට පිට තෙවැනි අවුරුද්දටත් වැඩි වූයේ 1960 දී රාත්තල් කෝටි 43.5 ක් වූ අතර 1961 දී කෝටි 45.5 ක් විය. අපනයන කැරුණ තේ ප්‍රමාණය ද වැඩි විය. තාවකාලික සංඛ්‍යා අනුව 1961 ලෝකයේ තේ නිෂ්පාදනය මෙතෙක් සටහන්ව නොමැති ප්‍රමාණයකට වැඩි වී තිබේ. (සියයට 8)* නිෂ්පාදනය වැඩිවීමේ බලපෑම විශෙෂයෙන් දැනෙන්නට වූයේ එම වර්ෂයේ අවසාන කොටසේ දී ය.

* ජාත්‍යන්තර තේ කොමිටියේ මාසික සමීක්ෂණ සංඛ්‍යා. සාරාංශය

1961 ප්‍රථම භාගයේදි කොළඹ වෙන්දේසියේ තේ මිල පසුගිය අවුරුද්දට වඩා තරමක් ඉහළ මට්ටමක පැවතිණි. එහෙත් තුන්වැනි කාර්තුවේ දී මිල පසුගිය වර්ෂයට වඩා තරමක් අඩු විය. අවුරුද්දේ අවසාන කොටසේ දී, විශෙෂයෙන් සතරවැනි කාර්තුවේ දී, කොළඹ වෙන්දේසියේ තේ මිල පසුගිය වර්ෂයේ සම කාලය තුළ ලැබුණ මිලට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය. පසුගිය වර්ෂයේ සම කාලයට වඩා තේ මිල අඩුවීමට එක් හේතුවක් වූයේ මේ මාසවල සාමාන්‍යයෙන් උසස් මට්ටමක පවත්වා ගනු ලබන තේවල තත්වය එසේ පවත්වා ගෙන යාමට අපොහොසත්වීමය. සමහරවිට මෙයට වඩා වැඩි බලපෑමක් ඇති කළ අනෙක් හේතුව වූයේ මේ වකවානුවේ ලෝකයේ තේ නිෂ්පාදනය වැඩිවීමය. මේ නිසා උසස් තත්වයක ඇතැයි සැලකෙන උස් බිම් වගාවේ තේ 1960 අවසාන කාර්තුවේදී රාත්තලක් රු. 2·15 ක් වූ අතර, 1961 අවසානයේ දී රු. 1.94 කට අඩු විය. අනෙකුත් වර්ගවල මිල මීට වඩා වේගයෙන් පහළ වැටිණි. 1960 සිව් වැනි කාර්තුවේ දී සාමාන්‍යයෙන රු. 1.87 ක් වූ මැදි බිම් හා පහත් බිම් වගාවේ තේ රාත්තලකට 1961 අවසාන කාර්තුවේ දී ලැබුනේ රු. 1.52 කි. එහෙත් 1961 ප්‍රථම භාගයේ පැවැති ඉතා හොඳ මිල නිසා අවුරුද්ද මුළු වශයෙන් ගෙන බලනවිට සාමාන්‍ය තේ මිල පහළ වැටී ඇත්තේ මඳ වශයෙනි. 1960 දී කොළඹ වෙන්දේසි පොළේ සියලුම තේ වර්ගවල සාමාන්‍ය මිල රාත්තලක් රු. 1.88 ක විය. 1961 දී මෙය රු. 1.83 ක් විය. එක්සත් රාජධානියේ ද සෑම තේ වර්ගයකම මිල කොළඹ වෙන්දේසියේ මිල ක්‍රමයම පුළුල් ලෙස අනුගමනය කළේය. අවුරුද්දේ ප්‍රථම භාගයේ දී ලංඩනයේ හැම වර්ගයකම තේ මිල පසුගිය වර්ෂයේ ඒ කාලය තුළදීට වඩා වැඩි විය. 1961 දෙවැනි භාගයේ දී කොළඹ වෙන්දේසි පොළේ මිල අනුව ලංඩනයේ තේ මිල ද අඩු විය.

සංඛ්‍යා සටහන II—16

**තේ නිෂ්පාදනය, අපනයන ප්‍රමාණ සහ මිල**

| වර්ෂය | නිෂ්පාදනය | අපනයන | | කොළඹ වෙන්දේසියේ රාත්තලක සාමාන්‍ය මිල | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය රාත්තල් දශලක්ෂ | ප්‍රමාණය රාත්තල් දශලක්ෂ | රාත්තලක තෑ: වි: ස මිල රු. ශත | උස් බිම් වගාව රු. ශත | මැදි බිම් වගාව රු. ශත | පහත් බිම් වගාව රු. ශත | සියලුම තේ වර්ග රු. ශත |
| 1955 .. | 380 | 362 | 3·30 | 2·34 | 2·04 | 2·40 | 2·24 |
| 1956 .. | 376 | 348 | 3·00 | 2·50 | 1·96 | 1·88 | 2·16 |
| 1957 .. | 398 | 368 | 2·78 | 2·05 | 1·61 | 1·88 | 1·86 |
| 1958 .. | 413 | 411 | 2·75 | 2·11 | 1·51 | 1·48 | 1·73 |
| 1959 .. | 413 | 384 | 2·72 | 2·13 | 1·69 | 1·67 | 1·85 |
| 1960 .. | 435 | 410 | 2·67 | 2·03 | 1·75 | 1·83 | 1·88 |
| 1961 .. | 455 | 426 | 2·62 | 1·99 | 1·72 | 1·74 | 1·83 |

සංඛ්‍යා – ලංකා රේගු වාර්තා, කොළඹ තේ වෙන්දේසිකාර සංගමය සහ කොළඹ තේ පාලක ගේ පරිපාලන වාර්තාවලිනි.

## රබර්

1961 දී රබර් නිෂ්පාදනය රාත්තල් කෝටි 21.5 ක් විය. මෙය පසුගිය වර්ෂයේදීට වඩා මඳක් අඩුය. පිටරට පටවන ලද රබර් ප්‍රමාණයෙහි ද අඩුවක් ඇති විය. අවුරුද්දේ අකාලයේ නොකඩවාම ඇති වූ වැසි නිසා කිරි කැපීමට බාධා ඇති වූයෙන් 1961 දී රබර් නිෂ්පාදනය අඩු විය. පසුගිය අවුරුද්දේ නොකඩවාම පහළ වැටෙමින් තුබුණ රබර් මිල 1961 දී ද පහළ වැටෙන්නට විය.

1952 සිට ලෝකයේ වැඩි වෙමින් පැවැති ස්වාභාවික රබර් භාවිතය 1961 දී අඩුවන ලකුණු පහළ වන්නට විය. 1961 සඳහා අර්ධ වශයෙන් ලැබී ඇති සංඛ්‍යා අනුව පසුගිය අවුරුද්දට වඩා 1961 දී ද ස්වභාවික රබර් භාවිතය මඳ වශයෙන් අඩු වී ඇති බවක් හෙළි වෙයි. 1961 මුල් කාර්තු තුනට ගැනෙන බොහෝ මාසවල ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජ්‍යය හා චීනය වැනි රබර් භාවිතයට ගන්නා ප්‍රධාන රටවල් ගත් ස්වභාවික රබර් ප්‍රමාණය 1960 සම කාලච්ඡේදයේ දී ගත් ප්‍රමාණයට වඩා අඩු වී ඇත. මේ රටවල් සහ රබර් භාවිතයට ගන්නා බටහිර යුරෝපයේ අනෙකුත් රටවල රබර් භාවිතය අඩුවී-මෙන් වූ පඩුව නැගෙනහිර යුරෝපයේ රටවල වැඩි වී ඇතැයි වාර්තා වී ඇති රබර් භාවිතයෙන් සම්පූර්ණයෙන් පිරිමැසී ගියේ නොවේ. රබර් මිල නොකඩවාම අඩුවීම නිසා රබර් තීරු බද්ද රාත්තලකට සත 30 සිට සත 20 දක්වා පෙබරවාරි මාසයේ දී අඩු කිරීමට සිදුවිය. අවුරුද්දේ අවසාන භාගයේ දී රබර් සඳහා අනුක්‍රම පරිමාණ තීරු බද්දක් පැනවීම ගැන රජයේ විශෙෂ සැලකිල්ල යොමු වූයේ 1961 නොවැම්බර් 26 වැනි දින එය පනවන ලදී. සතිපතා නියම වන මේ අපනයන තීරු බද්ද සඳහා ඉකුත් සතියේ ලංඩනයේ නො. 1 සීට් රබර් සඳහා ගෙවුන මිල කොළඹ එම වර්ගයේ රබර්වල නැ. වි. ස. මිලට පරිවර්තනය කොට ගණන් බලනු ලැබේ. මෙසේ ඇස්තමේන්තු කරන කොළඹ මිල රාත්තලක් සත 94 වන විට අඩුම ගණනේ රාත්තලකට සතයක් බදු වශයෙන් ගෙවිය යුතුය. මින් වැඩිවන මිල සමග තීරු බද්දද අනුක්‍රමයෙන් වැඩි වෙයි. මේ රාත්තලක් 1.23 ක් වූ විට බදු වශයෙන් සත 14 ක් ද, රු 1·68 ක් වූ විට සත 41 ක් ද ගෙවිය යුතුය. රාත්තලක මිල රු. 2·44 ක් වූ විට උපරිම බද්ද වන රු. 1.05 ක් ගෙවිය යුතුය.

සංඛ්‍යා සටහන II—17

**රබර් නිෂ්පාදනය, අපනයන සහ මිල**

| වර්ෂය | නිෂ්පාදනය රු. දශලක්ෂ | අපනයන රු. දශලක්ෂ | රාත්තලක නැ. වි. ස. මිල රාත්තලක මිල | ආර් එස්. එස්. නො. 1 කොළඹ වෙළෙඳ මිල රාත්තලක මිල රු. |
|---|---|---|---|---|
| 1955 .. .. .. | 210 | 222 | 1·58 | 1·28 |
| 1956 .. .. .. | 214 | 193 | 1·52 | 1·45 |
| 1957 .. .. .. | 220 | 209 | 1·44 | 1·16 |
| 1958 .. .. .. | 224 | 207 | 1·25 | 0 93 |
| 1959 .. .. .. | 205 | 206 | 1·45 | 1·25 |
| 1960 .. .. .. | 218 | 235 | 1·61 | 1·24 |
| 1961 .. .. .. | 215 | 197 | 1·32 | 1·01 |

සංඛ්‍යා - රබර් පාලක තැනගේ පරිපාලන වාර්තාව, ලංකා රේගු වාර්තාව සහ කොළඹ රබර් වෙළෙඳ සංගමයේ වාර්තා වලිනි.

## පොල් නිෂ්පාදිත

1960 අවසාන භාගයේ දී පොල් තෙල් ඇතුළු මේද සහ තෙල් ලෝක වෙළෙඳ පොළට අධික ලෙස සැපයෙන්නටවීම නිසා ලංකාවේ පොල් තෙල් මිල සීඝ්‍රයෙන් පහළ වැටෙන්නට විය පසුගිය වාර්ෂික වාර්තාවේ සඳහන් කොට ඇති පරිදි

1960 පළමුවැනි කාර්තුවේ සිට අවසාන කාර්තුව වන විට, පොල් නිෂ්පාදිත තුනේ අපනයන මිල දර්ශකය, සියයට 28 කින් අඩු විය. 1961 මුල් මාස කීපය තුළ දී පොල් මිල තරමක් හොඳ වුවද, එය පැවැතුනේ නොවේ. අවුරුද්දේ අනෙක් මාසවල දී මිල, තවත් පහළ වැටිණි. නොවැම්බර් මාසය වන විට ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනේ අපනයන මිල දර්ශකය 1955 ට පසු වැටුන පහළම අංකයට අඩු විය. වර්ෂය මුළුමනින් ගත් විට මිල සියයට 22 කින් පහළ වැටී ඇත. ලෝක වෙළෙඳ පොලේ මිල අඩුවීමත් සමගම අපනයන තීරු බද්ද 1961 මැයි මාසයේ දී අඩු කරන ලදී. අලුත් බදු අනුව පොල් තෙල් ටොන් එකකට රු. 140/= ක් ද කොප්පරා ටොන් එකකට රු. 185/= ක් ද කපාපු පොල් ටොන් එකකට රු. 100/= ක් ද ගෙවිය යුතුය. පොල් නිෂ්පාදිත විශාල ලෙස වැඩිවීම නිසා පුන්නක්කු ප්‍රමාණයෙහි ද තාවකාලික අධිකයක් ඇති වූයේ පුන්නක්කු ටොන් එකකට රු. 200/= ක ඉතා අධික අපනයන තීරු බද්දක් පනවන ලදී. එහෙත් පුන්නක්කු පිටරට යැවීම පහසු කරනු සඳහා ඔක්තෝබර් මාසයේ දී පුන්නක්කු බද්ද ටොන් එකකට රු 25 ක් කරන ලදී.

සංඛ්‍යා සටහන 11—18

**ප්‍රධාන පොල් නිෂ්පාදිත - අපනයන, ප්‍රමාණ සහ මිල**

| වර්ෂය | කොප්පරා | | පොල්තෙල් | | කපාපු පොල් | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණන් | හොණ්ඩර යකා තා. වි. ස මිල රු. | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණන් | හොණ්ඩර යකා තා. වි. ස මිල රු. | ප්‍රමාණය හොණ්ඩර දහස් ගණන් | හොණ්ඩර යකා තා. වි. ස මිල රු. |
| 1955 | 1,367 | 41·90 | 1,945 | 58·26 | 1,157 | 47·36 |
| 1956 | 1,155 | 42·43 | 1,698 | 58·42 | 1,275 | 50·86 |
| 1957 | 695 | 47·95 | 1,081 | 62·80 | 978 | 56·08 |
| 1958 | 554 | 52·97 | 887 | 69·80 | 1,135 | 63·72 |
| 1959 | 852 | 60·52 | 1,389 | 84·41 | 1,050 | 71·45 |
| 1960 | 583 | 55·23 | 1,110 | 71·83 | 1,099 | 65·23 |
| 1961 | 1,100 | 43·47 | 1,837 | 58·16 | 967 | 49·23 |

සංඛ්‍යා - ලංකා රේගු වාර්තාවලිනි.

පොල් නිෂ්පාදනය සහ අපනයන නොවූ විරූ ලෙස වැඩි වී ඇති බව ඉහත පරිච්ඡේදයෙහි සඳහන් කැරිනි. කොප්පරා අපනයන පසුගිය අවුරුද්දට වඩා සියයට 89 කින් ද පොල් තෙල් අපනයනය, සියයට 65 කින් ද වැඩි විය. එහෙත් කපාපු පොල් අපනයනය අඩු වූයේ 1951 වැටුන පහළම මට්ටමට 1961 දී වැටිනි.

## ආනයන

ආනයන සැකසුම පහත දැක්වෙන සටහනින් දැක්වේ.

සංඛ්‍යා සටහන II—19

### තෝරා ගත් ආනයන—ප්‍රධාන ගණ වශයෙන්

| භාණ්ඩ | වටිනාකම රු. දශලක්ෂ | | | සියයට ගණන | | |
|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1959 | 1960 | 1961 |
| 1. පාරිභෝගික භාණ්ඩ .. | | | | | | |
| **(අ) ආහාර පාන** | | | | | | |
| i සහල් .. .. .. | 283 | 242 | 217 | 14·1 | 12·3 | 12·7 |
| ii පිටි .. .. .. | 106 | 65 | 70 | 5·3 | 3·3 | 4·1 |
| iii සීනි .. .. .. | 75 | 79 | 78 | 3·7 | 4·0 | 4·6 |
| iv කිරි සහ කිරි නිෂ්පාදිත .. | 76 | 70 | 65 | 3·8 | 3·6 | 3·8 |
| v මස්, මාළු සහ බිත්තර | 94 | 111 | 72 | 4·7 | 5·7 | 4·2 |
| vi කඩල, ඇටවර්ග සහකුළුබඩු | 92 | 102 | 104 | 4·6 | 5·2 | 6·1 |
| **(ආ) රෙදි පිළි** | 148 | 152 | 135 | 7·4 | 7·8 | 7·9 |
| **(ඇ) අනෙකුත් පාරිභෝගික භාණ්ඩ** | | | | | | |
| i මෝටර් කාර් .. .. | | | | | | |
| ii ඔරලෝසු .. .. .. | 50 | 53 | 8 | 2·5 | 2·7 | 0·5 |
| iii සම්පූර්ණ රේඩියෝ රිසීවර් .. | 16 | 29 | — | 0·8 | 1·5 | — |
| | 10 | 12 | 3 | 0·5 | 0·6 | 0·2 |
| **2. අනතර් භාණ්ඩ** | | | | | | |
| i පොහොර වර්ග .. .. | | | | | | |
| ii පැටුල් නිෂ්පාදිත .. | 61 | 58 | 57 | 3·0 | 2·9 | 3·3 |
| | 132 | 118 | 126 | 6·6 | 6·0 | 7·4 |
| **3. ආයෝජන භාණ්ඩ** | | | | | | |
| i ගොඩනැගිලි උපකරණ .. | 72 | 80 | 71 | 3·6 | 4·1 | 4·2 |
| ii ගමනා ගමන උපකරණ .. | 36 | 25 | 23 | 1·7 | 1·3 | 1·4 |
| iii යන්ත්‍රෝපකරණ .. | 30 | 25 | 21 | 1·5 | 1·3 | 1·2 |
| **4. ඉහත ශීර්ෂවල එකතුව** | 1280 | 1221 | 1050 | 63·8 | 62·3 | 61·7 |
| **5 අනෙකුත් ආනයන** | 725 | 739 | 653 | 36·2 | 37·7 | 38·3 |
| **6 ආනයන එකතුව** | 2005 | 1960 | 1703 | 100·0 | 100·0 | 100·0 |

සංඛ්‍යා—ලංකා රේගු වාර්තාවලිනි

1959 ආනයන පරිමාවෙහි ඇති වූ අධික වැඩිවීම 1960 දී නතර කරන ලදී. 1961 ආනයන පරිමාව දැඩි ලෙස සීමා කැරුනේ පසුගිය වර්ෂයේ පැවැති ප්‍රමාණයට වඩා සියයට 19 කින් අඩු විය. මෑත කාලයෙහි කිසිම වර්ෂයක ආනයන පරිමාව මෙතරම් සීග්‍රයෙන් අඩු වූයේ නොවේ. ආනයන පරිමාව, 1955 ට පසු අඩු වූ පහළ ම මට්ටම මෙය විය. මහ බැංකු වෙළෙඳ දර්ශකයන්හි ඇතුළත් සියලුම වර්ගවල ආනයන පරිමාව අඩු විය. පාරිභෝගික භාණ්ඩ සියයට 25 කින්ද අන්තර් භාණ්ඩ සියයට 2 කින් ද ආයෝජන භාණ්ඩ සියයට 13 කින් ද අඩු විය.

පාරිභෝගික භාණ්ඩ වර්ගයේ "ආහාර පාන" ගණය සියයට 8 කින් අඩු විය මෙයට හේතු වූයේ මෙරටට ගෙන්වන ප්‍රධාන ආහාර වර්ග සමහරක ගෙන්වීම අඩුවීමය. මෙසේ 1961 දී ගෙන්වන ලද සහල් ප්‍රමාණය ටොන් 4,61,600 ක් විය. මෙය පසුගිය පස් අවුරුද්දටම වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුය. එසේම මාලුනිෂ්පාදිත සහ ධාන්‍ය ඇට ගෙන්වීම බොහෝ සෙයින් අඩු වූ අතර, අනෙකුත් ආහාර ද්‍රව්‍ය වන ක්‍රිරි, ආහාර, අර්තාපල් ආදිය ගෙන්වීම ද සුළු වශයෙන් අඩු විය

අවුරුද්ද තුළ ගෙන්වන ලද උප භාණ්ඩවල* වටිනාකම ද අඩු විය. 1960 දී මෙහි වටිනාකම රුපියල් කෝටි 27.6 ක් වූ අතර, 1961 දි රුපියල් කෝටි 23.2 කට අඩු විය. ගෙන්වන ලද රෙදිපිළි ප්‍රමාණය ද අඩු විය. (සියයට 13) විශාල වශයෙන් අඩු වී ඇත්තේ "අනෙකුත් පාරිභෝගික" ගණයේ වටිනාකමය. මහ බැංකු වෙළෙඳ දර්ශක අනුව "අනෙකුත් පාරිභෝගික"වල වටිනාකම, මුළු ආනයන වටිනාකමින් හයෙන් එකකට වඩා ටිකක් අඩුය. මේ ගණයෙහි ආනයන පරිමා-දර්ශකය 1960 දී 48 ක් වූ අතර 1961 දී 49 කට අඩු විය. (1958 = 100) මෙය පසුගිය වර්ෂයට වඩා සියයට 67 ක අඩුවීමෙකි.

අනෙකුත් පාරිභෝගික භාණ්ඩ ගණයට ඇතුළත් භාණ්ඩ විශාල ලෙස ගෙන්වන බවත් 1960 දක්වා මේ භාණ්ඩවල ආනයන පරිමාව නොකඩවාම සීඝ්‍රයෙන් වැඩි වී ඇති බවත්, ඊට අවුරුදු දෙකකට පෙරාතුව ගෙන්වනු ලැබූ ප්‍රමාණයට වඩා සියයට 48 කින් මේ වැඩි වී ඇති බවත්, පසුගිය වාර්ෂික වාර්තාවෙහි දක්වන ලදී. 1960 අගෝස්තු මාසයේ ද මේ භාණ්ඩ සම්බන්ධයෙන් තීරු බදු, ආනයන සහ ණය සීමා කිරීම් ඇති කළේ, අවුරුද්ද අවසාන වන විට මේ ගණයේ භාණ්ඩ ගෙන්වීම අඩුවන ලකුණු පහළ විය. මේ හේතුවෙන් 1960 අවසාන කාර්තුවේ දී ගෙන්වන ලද භාණ්ඩ ප්‍රමාණය එම වර්ෂයේ මුල් කාර්තුතුනේදීට වඩා සියයට 42 කින් අඩු විය. 1960 අගෝස්තු මාසයේ දී පනවන ලද සීමා කිරීම් 1961 ජනවාරි මුල හරියේ දී තවත් දැඩි කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වූයේ මේ ගණයේ භාණ්ඩ ගෙන්වීම විශාල ලෙස අඩුවීමය

වටිනාකමේ හා ප්‍රමාණයේ සීමාවක් නොමැතිව මෙතෙක් ගෙන්විය හැකිව තුබූ භාණ්ඩ විශාල සංඛ්‍යාවක් ගෙන්වීම පෞද්ගලික බලපත්‍ර ක්‍රමයට යටත් කළේය. මෙයින් ගෙන්වීමේ ප්‍රමාණයත් වටිනාකමත් සීමා කළේය. දෙවැනිව සමහර භාණ්ඩ ගෙන්වීම තහනම් කරන ලදී.

ගණ වශයෙන් බෙදා දක්වා ඇති ආනයන බොහෝවක වටිනාකම පහළ දැක්වෙන සටහනේ ඇතුළත්ය.

සංඛ්‍යා සටහන II—20

**1961 ජනවාරි මාසයේ දී ආනයන සීමාකිරීම් වලට ඇතුළත් වූ භාණ්ඩවලින් තෝරාගත් ලැයිස්තුව ගණ වශයෙන් බෙදා**

රුපියල් දශලක්ෂ

| | 1960 | 1961 | වටිනාකමේ අඩුවීම |
|---|---|---|---|
| ආහාරපාන .. .. .. .. .. .. | 35·0 | 8·5 | — 26·5 |
| රෙදිපිළි (අ) .. .. .. .. .. .. | 209·5 | 187·6 | — 21·9 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ .. .. .. | 156·1 | 64·8 | — 91·3 |
| මෙයින්, මෝටර් කාර් .. .. .. .. | 53·1 | 8·0 | — 45·1 |
| ඔරලෝසු (ආ) .. .. .. .. .. | 28·6 | 0·1 | — 28·5 |
| එකතුව | 400·6 | 260·9 | —139·5 |

සංඛ්‍යා:- ලංකා රේගු වාර්තාවලිනි.

(අ) යාරය රු. 2 කට වැඩි රෙදි සඳහා ආනයන රෙගුලාසි බලපවත්වයි. රේගු වාර්තාවල මේ රෙදිපිළි වෙනම සටහන් කොට නොමැත. එම නිසා ගෙන්වන ලද මුළු රෙදිපිළිවල වටිනාකම මේ සටහනේ දැක්වේ. මේ සටහනට ඇතුළත්කර ඇති භාණ්ඩ 11-1-9 වැනි සංඛ්‍යා සටහනේ භාණ්ඩවලට වඩා වැඩිය. එහි භාණ්ඩ ප්‍රමාණය දර්ශක සකසා ගැනීමට පමණක් සීමා කොට ඇත.

(ආ) ඔරලෝසු ගෙන්වීම මෙයට පෙරාතුව 1960 අගෝස්තු 12 වැනි දින පෞද්ගලික බල පත්‍ර යටතට ගන්නා ලදී.

* මේ ගණයට ටින්කිරි, කිරි ආහාර, පිටිසාළ කිරි, බටර්, උකුකළ කිරි, උම්බලකඩ, වියළි හාල්මැස්සන්, ලුණු මාලු සහ කරවල, වියළි ඉස්සන්, අර්තාපල්, පරිප්පු, මුංඇට, ධාන්‍ය ඇට, රතුලූණු, වියළි මිරිස් ඇතුළත් වෙයි.

අන්තර් භාණ්ඩ ආනයන එතරම් වේගයෙන් අඩු වූයේ නොවේ. සකස් නොකළ දුම්කොළ, දූවපල්ප්, කඩදාසි (පුවත් පත්) ගල් අඟුරු, කපු නූල්වැනි අමු ද්‍රව්‍ය ගෙන්වීම මඳක් අඩු විය. ආයෝජන භාණ්ඩ ගණයෙහි ගොඩනැගිලි උපකරණ සහ යන්ත්‍රෝපකරණ ගෙන්වීම අඩු විය.

ඉහත පරිච්ඡේදයන්හි සඳහන් කළ පරිදි 1960 දී රුපියල් කෝටි 196.0 ක්වූ ආනයන වටිනාකම, 1961 දී රුපියල් කෝටි 170.3 කට අඩු විය. අවුරුද්දක සිට අනෙක් අවුරුද්දට ආනයන වටිනාකම් මෙතරම් පහළ වැටුන වර්ෂයක් යුද්ධයෙන් පසු නොවූ විරූය. ආනයන වටිනාකම මෙසේ සීඝ්‍රයෙන් අඩු වුවද II – 19 වැනි සටහනින් දැක්වෙන පරිදි, ආනයන වියදමෙන් විශාල කොටසක් තවමත් පාරිභෝගික භාණ්ඩ සඳහා වැය වෙයි. මේ සටහනේ තෝරාදී තිබෙන ප්‍රධාන ශීර්ෂ හය සඳහා මුළු ආනයන වියදමෙන් 1959 සියයට 36.2 ක් ද 1960 සියයට 34.1 ක්ද වැය වී ඇති අතර, 1961 දී ද ඒ සඳහා සියයට 35.5 ක් වැය වී ඇත. සහල් සහ අනෙකුත් ආහාර වර්ග ගෙන්වීමට සාමාන්‍ය වශයෙන් ඉඩ ලැබිණි නම්, මේ සඳහා මෙයට වඩා වැය විය හැකිව තිබිනි. පාරිභෝගික භාණ්ඩ ආනයනයට අමතරව රෙදිපිළි ගෙන්වීම සඳහා ද ආනයන වියදමෙන් සෑහෙන කොටසක් වැයවිය. 1960 දී රුපියල් කෝටි 15.2 ක්වූ රෙදිපිළි ආනයන වටිනාකම, 1961 දී රුපියල් කෝටි 13.5 කට මඳ වශයෙන් අඩු වුව ද, 1961 එය මුළු ආනයන වටිනාකමින් සියයට 7.9 ක් විය. ඊට ප්‍රථම වර්ෂයේ එය සියයට 7.8 ක්වූ අතර, වර්ෂ දෙකකට උඩ දී එය සියයට 7.4 ක් විය.

සමහර අන්තර් භාණ්ඩවල ආනයන පරිමාව සතුටුදායක ප්‍රමාණයක පැවැතෙමින් තිබිණි. පොහොර ආනයන වටිනාකම තරමක් දුරට වැඩිවූ අතර එය මුළු ආනයන වියදමෙන් සියයට 3.3 ක් (1960 මෙය 2.9 ක්) විය. එසේම තෝරා ගත් ආයෝජන භාණ්ඩ සඳහා කැරුණ වියදම් ද වැඩි විය. ඒ නිසා යකඩ වානේ සහ යන්ත්‍ර සඳහා කැරුණ වියදම රුපියල් කෝටි 18.8 ක් විය. මෙය පසුගිය වර්ෂයේ (රුපියල් කෝටි 18.0) ප්‍රමාණයට වඩා වැඩිය. මේ හේතුවෙන් 1961 මුළු ආනයන වියදමෙන් මෙය සියයට 11.0 ක් විය. 1960 සියයට ගණන 9.2 කි.

1961 දී ආනයන සැකසුමේ සැලකිය යුතු වෙනසෙක් ඇති විය. මෙයට හේතු වූයේ පාරිභෝගික භාණ්ඩ විශාල ගණනකට බලපාන අන්දමට ආනයන සීමා කිරීමය. එහෙත් ආනයන වියදමේ ප්‍රධාන ශීර්ෂ දෙකක් වන ආහාර සහ රෙදිපිළි සඳහා වන වියදම් පෙර සේම උසස් මට්ටමක පැවැතිණි. 1959 යේ,අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන 1960 ප්‍රමාණයට වඩා අඩු විය.

**වෙළෙඳාම පැවැති ආකාරය.**

වෙළෙඳාම පැවැති ආකාරය ප්‍රධාන ප්‍රදේශ හා මුදල් කලාප වශයෙන් වෙන් කොට II වැනි පරිශිෂ්ටයේ 31 වැනි සටහනින් දක්වා ඇත.

1961 දී ලංකාවේ වෙළෙඳාම ප්‍රධාන වශයෙන්ම පැවැතියේ රත්පවුම් කලාපය සමගය. පෙර වර්ෂවල දී මෙන්ම මේ කලාපය සමග පැවැති වෙළෙඳාමේ වටිනාකම අනෙක් හැම රටක්ම සමග පැවැති වෙළෙඳාමේ වටිනාකමට වඩා මඳක් (අපනයන 55.2% ආනයන 56.1%) වැඩිය. මෙම කලාපයට යැවුන භාණ්ඩ ප්‍රමාණය (රුපියල් කෝටි 95.72) 1960 පමණටම පැවැතිණි. එහෙත් 1960 දී රුපියල් කෝටි 105.38 ක්වූ මෙය 1961 දී රුපියල් කෝටි 95.58 දක්වා පහළ වැටිණි. මේ හේතුවෙන් රුපියල් කෝටි 0.14 ක සුළු වෙළෙඳ අතිරික්තයක් ඇතිවිය. රත්පවුම් කලාපීය ආනයන වටිනාකම පහළ වැටුනේ බුරුමයෙන් ගෙන්වූ සහල් ප්‍රමාණය වැඩි වී තිබියදීත්ය. ප්‍රධාන වශයෙන් සහල් ඇතුළුව බුරුමයෙන් ගෙන්වන ලද භාණ්ඩවල මුළු වටිනාකම, 1960 දී රුපියල් කෝටි 12.3 ක් වූයේ 1961 දී රුපියල් කෝටි 18.5 කට ඉහළ ගියේය. එහෙත් රත්පවුම් කලාපයේ අනෙකුත් රටවලින් ගෙන්වන ලද භාණ්ඩ ප්‍රමාණය අඩුවීමෙන් මෙම වැඩිවීම පමණටත් වඩා මැකී ගියේ ය. 1961 දී එක්සත් රාජධානියෙන් ගෙන්වන ලද භාණ්ඩවල වටිනාකම (1960 දී රුපියල් කෝටි 43.4 ක) රුපියල්

කෝටි 36·2 ට පහළ වැටිණි. එරටින් ගෙන්වන ප්‍රධාන භාණ්ඩ වර්ගයන් අතුරින් රථවාහන (රුපියල් කෝටි 3·5) හා පොහොර (රුපියල් කෝටි 0·6) ගෙන්වීම අඩු විය. ඉන්දියාවෙන් ගෙන්වූ භාණ්ඩ (1960 දී රුපියල් කෝටි 26·8 ක් වූ) රුපියල් කෝටි 20·7 කට අඩු විය. 1961 දී ඉන්දියාවෙන් ගෙන්වන ලද කරවල හා සක්කරා 1960 දීට වඩා පිළිවෙළින් රුපියල් කෝටි 3·1 කින් හා රුපියල් කෝටි 1·3 කින් අඩු විය.

ඩොලර් කලාපයට යවන ලද භාණ්ඩවල වටිනාකම (රුපියල් කෝටි 1·0 කින්) රුපියල් කෝටි 21·77 ට පහළ වැටුන අතර ගෙන්වන ලද භාණ්ඩවල වටිනාකම (රුපියල් කෝටි 1·43 කින්) රුපියල් කෝටි 11·01 ට ඉහළ ගියේය. මෙයින් රුපියල් කෝටි 13·76 ක වඩා සුළු වෙළෙඳ අතිරික්තයක් (1960 දී රුපියල් කෝටි 16·17 ක්) ඇතිවිය.

යුරෝපීය ආර්ථික ප්‍රජාවට අයත් රටවලට යැවූන භාණ්ඩ ප්‍රමාණය මෑත අවුරුදු වලදී බොහෝ සෙයින් වැඩි වී උසස් මට්ටමක පැවතුනද (1957 දී රුපියල් කෝටි 11·62 ක් හා 1959 දී රුපියල් කෝටි 20·42 ක් වූ) 1961 දී ඒ රුපියල් කෝටි 14·7 ට පහළ වැටිණි. අපනයන වටිනාකම මෙසේ පහළ වැටීමට හේතු වූයේ ජර්මනිය මිලට ගත් රබර් හා කපාපු පොල් ප්‍රමාණයන් (1960 දී රුපියල් කෝටි 5·0 ක් වූ මෙය 1961 දී රුපියල් කෝටි 3·5 ට) හා ඉතාලිය මිලට ගත් පොල්තෙල් ප්‍රමාණයන් (1960 දී රුපියල් කෝටි 2·2 ක 1961 දී රුපියල් කෝටි 1·2 ට) අඩුවීමය. යුරෝපීය ආර්ථික ප්‍රජාවෙන් මෙරටට ගෙන්වන ලද භාණ්ඩවල වටිනාකම ද (1960 දී රුපියල් කෝටි 19·72 ක් වූ මෙය 1961 දී රුපියල් කෝටි 17·9 ට) අඩු විය. ජර්මනියෙන් ගෙන් වූ මෝටර් රථ සඳහා වූ මුළු වටිනාකම ද (1960 දී රුපියල් කෝටි 0·8 ක් වූ මෙය 1961 දී රුපියල් කෝටි 0·2 ට) අඩු විය.

ලංකාවත් චීනයත් අතර වෙළෙඳාම 1957 දී එරට සමග ඇති කරගත් වෙළෙඳ හා ගෙවීම් ගිවිසුමක විධිවිධාන යටතේ පවතී. භාණ්ඩ හුවමාරුව පිළිබඳව දෙරට අතර කරගත් මූල් ගිවිසුම හා අදාළ ගිවිසුම් අනුව 1961 දී ලංකාව රබර් මෙට්‍රික් ටොන් 31,000 ක් විකිණීමට ද චීනයෙන් සහල් ටොන් 2,00,000 ක් මිලට ගැනීමට ද ගිවිසගෙන ඇත. තවද මූල් ගිවිසුම අනුව 1961 දී චීනයෙන් ලංකාවට රුපියල් කෝටි 10.0 ක වටිනාකමට භාණ්ඩ ද ලංකාවෙන් චීනයට ඒ හා සමාන වටිනාකමට භාණ්ඩ ද සැපයීමට නියමිතය.

සංඛ්‍යා සටහන II—21

**ලංකා - චීන වෙළෙඳාම**

| | අපනයන | | ආනයන | | වෙළෙඳ ශේෂය රුපියල් දශලක්ෂ |
|---|---|---|---|---|---|
| | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු දේශීය අපනයනයන්ගේ සියයට ගණන | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු ආනයනයන්ගේ සියයට ගණන | |
| 1956 .. .. .. | 182 | 11·0 | 134 | 8·2 | +48 |
| 1957 .. .. .. | 167 | 10·5 | 84 | 4·6 | +83 |
| 1958 .. .. .. | 78 | 4·7 | 152 | 8·8 | —74 |
| 1959 .. .. .. | 78 | 4·6 | 150 | 7·5 | —72 |
| 1960 .. .. .. | 121 | 6·6 | 132 | 6·8 | —12 |
| 1961 .. .. .. | 83 | 4·9 | 35 | 2·0 | +48 |

සංඛ්‍යා: ලංකා රේගු වාර්තාවලිනි.

ලංකාවේ රේගු වාර්තා අනුව චීන - ලංකා වෙළෙඳාම පිළිබඳ සාමාන්‍ය විස්තරයක් II-21 සටහනෙහි දැක්වේ. අපනයන වටිනාකම පහළ වැටුනේ රබර් අපනයන (1960 දී රුපියල් කෝටි 12·1 හා 1961 දී රුපියල් කෝටි 6·0 ට) අඩුවීමෙනි. ආනයන වටිනාකම සැලකිය යුතු ලෙස පහළ වැටුනේ, චීනයෙන් ගෙන්වන ලද සහල්වල වටිනාකම (1960 දී රුපියල් කෝටි 11·0 1961 දී රුපියල් කෝටි 1.2 ට) තියුණු ලෙස අඩුවීමෙනි. එරටින් ගෙන්වන ලද රෙදිපිළිවල මුළු වටිනාකමෙහි (රුපියල් කෝටි 1·2) වෙනසෙක් නොවිණි.

එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව හා අනෙකුත් නැගෙණහිර යුරෝපීය රටවල් සමග ගිවිසගත් වෙළෙඳ හා ගෙවීම් ගිවිසුම්, වර්ෂය තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවැතිණි මෙම රටවල් සමූහය සමග වෙළෙඳම මෑත වර්ෂ කීපය මුළුල්ලේම වැඩි වූයේ 1961 දී තව දුරටත් වැඩි විය. 1961 දී මෙම රටවලට යවන ලද භාණ්ඩවල වටිනාකම රුපියල් කෝටි 7 28 ක් (1960 දී රුපියල් කෝටි 5·56 ක්) විය. මෙය මුළු දේශීය අපනයනයෙන් සියයට 4·5 ක් වෙයි.

සංඛ්‍යා සටහන II—22

**එක්සත් සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව හා නැගෙනහිර යුරෝපීය රටවල් සමග වෙළෙඳාම**

| වර්ෂය | අපනයන | | ආනයන | | වෙළෙඳ ශේෂය රුපියල් දශ ලක්ෂ |
|---|---|---|---|---|---|
| | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු දේශීය අපනයන යන්ගේ සියයට ගණන | වටිනාකම රුපියල් දශලක්ෂ | මුළු ආනයන යෙහි සියයට ගණන | |
| 1956 .. .. .. | 1·3 | 0·08 | 7·6 | 0·47 | — 6·3 |
| 1957 .. .. .. | 6·5 | 0·41 | 9·9 | 0·55 | — 3·4 |
| 1958 .. .. .. | 24·7 | 1·49 | 8·7 | 0·51 | +16·0 |
| 1959 .. .. .. | 27·3 | 1·56 | 23·4 | 1·16 | + 3·9 |
| 1960 .. .. .. | 55·6 | 3·04 | 21·4 | 1·09 | +34·2 |
| 1961 .. .. .. | 72·8 | 4·52 | 47·3 | 2·78 | +25·5 |

සංඛ්‍යා: ලංකා රේගු වාර්තාවලිනි

1960 දී මෙම රටවල් මිලට ගත් භාණ්ඩවලට ප්‍රධාන වශයෙන්ම ඇතුළත් වූයේ රබර්ය. මේ රටවලට යවන ලද සියලුම භාණ්ඩවල මුළු වටිනාකම රුපියල් කෝටි 5.56 ක් විය. මෙයින් රබර්වල වටිනාකම පමණක් රුපියල් කෝටි 4·78 කි. 1961 දී මිලට ගත් රබර්වල වටිනාකම රුපියල් කෝටි 6·22 ට ද පොල්තෙල්වල වටිනාකම රුපියල් කෝටි 0·79 ට ද ඉහළ ගියේය මේ භාණ්ඩවලින් වැඩි හරියක් මිලට ගනු ලැබුයේ රුසියාව (රුපියල් කෝටි 4·51 ක) හා පෝලන්තයයි. (රුපියල් කෝටි 2·21 ක) රුමේනියාවට යැවූ ප්‍රමාණය (රුපියල් කෝටි 0·52 ක) අඩු වූ අතර අනෙකුත් රටවලට යැවූ ප්‍රමාණය සැලකිය යුතු තරම් නොවේ.

මේ රටවලින් ගෙන් වූ භාණ්ඩවල මුළු වටිනාකම 1960 දී මඳක් පහළ වැටුණ ද, 1961 දී ඒ දෙගුණයකටත් වැඩියෙන් (රුපියල් කෝටි 4·73) ඉහළ ගියේය. මෙය මුළු ආනයනයන්ගෙන් සියයට 3 කට වඩා අඩුවූයේ මඳකිනි. පෝලන්තයෙන් ගෙන්වන ලද භාණ්ඩවල මුළු වටිනාකම වැඩි විය. (1960 කෝටි 0·05, 1961 කෝටි 2·42 ට) මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එරටින් ගෙන්වන ලද සීනි ප්‍රමාණය වැඩිවීමය. (රුපියල් කෝටි 1·72)

**වෙළෙඳ ගිවිසුම්**

1961 වර්ෂය තුළ වෙළෙඳ හා ගෙවීම් ගිවිසුම් ගණනාවක්ම ඇති කර ගන්නා ලදී. 1961 පෙබරවාරි 20 වැනි දින ඉරාකය සමග වෙළෙඳ ගිවිසුමක් ඇති කර ගනු ලැබිය. මේ ගිවිසුම වර්ෂයකට වලංගු වන අතර, නිරායාශයෙන් දීර්ඝ වීමේ විධිවිධාන ඊට ඇතුළත්ය. ගිවිසුම ප්‍රවේශ අවසරයක ස්වභාව දරන අතර දෙරට අතර හුවමාරු කැරෙන භාණ්ඩ ලැයිස්තුවක් තිබිණි. මෙම ගිවිසුමත් සමග හුවමාරු කැරුන ලියකියවිලි අනුව රටඉඳි ටොන් (මෙට්‍රික්) 8000 කට නො අඩු ප්‍රමාණයක් වාර්ෂිකව ඉරාකයෙන් ගෙන්වීමට ද ලංකාව පොරොන්දු වී ඇත.

1961 අප්‍රේල් 22 වැනි දින ප්‍රජාතන්ත්‍රවාදී ජර්මන් සමූහාණ්ඩුව (නැගෙනහිර ජර්මනිය) සමග ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙය දෙරට අතර වෙළෙඳ සබඳකම් දියුණු කිරීම සඳහා "අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක ජාතියට උසස්ම සැලකිල්ල දැක්වීමේ ක්‍රමය අනුව" අත්සන් තබන ලද්දකි මෙම ගිවිසුම නිරායාශයෙන්ම දීර්ඝ වීමට ඉඩ ඇතිව ප්‍රථමයෙන් වර්ෂයකට වලංගු කරන ලදී.

1961 මැයි 15 වැනි දින බල්ගේරියාව සමග වෙළෙඳ හා ගෙවීම් ගිවිසුමක් ඇති කරගනු ලැබිය. ගිවිසුම ප්‍රවේශ අවසරයක ස්වභාවයේවූ අතර දෙරට අතර හුවමාරු කැරෙන භාණ්ඩ ලැයිස්තුවක් ද එයට ඇතුළත්ව ඇත. ගෙවීම් ගිවිසුම අනුව රත්පවුම් 40,000 ක අන්‍යොන්‍ය වශයෙන් "ණයක්" ලැබේ මෙම ගිවිසුම් දෙකම ප්‍රථමයෙන් වර්ෂයකට වලංගුය. එහෙත් ඒවා නිරායාශයෙන් ම දීර්ඝ වීමට විධිවිධාන සලසා ඇත.

හන්ගේරියාවත් සමග 1956 ජූනි 4 වැනි දින ගිවිසගත් වෙළෙඳ ගිවිසුමට අතිරේක ගිවිසුම් ලේඛනයක් හා අලුත් ගෙවීම් ගිවිසුමක් ද 1961 සැප්. 12 වැනි දින ඇති කර ගනු ලැබිය. මේ ලේඛනයට ඇතුළත් අනෙකුත් කරුණු අතර අන්‍යොන්‍ය වශයෙන් එකිනෙක ජාතියට උසස්ම සැලකිල්ල දැක්වීමේ වගන්තිය පැහැදිළි කිරීම ද දෙරට අතර ආර්ථික හා කාර්මික සහයෝගතාවය ඇති කිරීම ද වෙයි. ගෙවීම් ගිවිසුමෙන් රත්පවුම් 40,000 ක අන්‍යොන්‍ය ණයක් ලැබේ. ගිවිසුම් දෙකම නිරායාශයෙන්ම දීර්ඝ වීමට විධිවිධාන සලසා තිබෙන අතර, ප්‍රථමයෙන් එක් වර්ෂයකට වලංගු කොට ඇත.

1961 දෙසැම්බර් 6 වැනි දින ඉන්දියාව සමග වෙළෙඳ ගිවිසුමක් ඇති කර ගනු ලැබිය. ගිවිසුමේ පරමාර්ථය වූයේ ලංකාවෙන් යවන කොප්පරා, පොල් තෙල්, රබර් හා යාපනයේ දුම්කොළ (හපන) හා ඉන්දියාවෙන් එවනු ලබන කරවල, බිඩි, වේවැල්, සක්කරු හා සියඹලා සම්බන්ධයෙන් විශේෂ වශයෙන් සලකා දෙරට අතර වෙළෙඳාම පහසු කිරීමය. එක් එක් භාණ්ඩ වර්ගයේ නියමිත ප්‍රමාණයක් දොළොස් මසක කාලයක් තුළ තම රටට ගෙන්වීම සඳහා දෙරට විසින්ම විධිවිධාන සලසනු ඇත.